ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5/6 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2007

අන්තර්ජාතික මානව හිමිකම් නීතිය - 3325/4325

කාලය - පැය තුනයි (03)

---

දිනය: 2007 මාර්තු 19වන දින    වේලාව - ප.ව.01.30 - 04.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

1. “මානව හිමිකම් යන්න බටහිර සමාජය තුල හටගත්තේය යන කාරණය නිසාවෙන්ම එය සම්පූර්ණයෙන්ම බටහිර සංකල්පයක් ලෙසට සලකනු ලැබිය නොහැක.”

   ඉහත සඳහන් ප්‍රකාශයෙහි වලංගුභාවය මානව හිමිකම් පිළිබඳව වූ දාර්ශනික හා ආගමික පදනම් මත හිඳ විවේචනාත්මකව අගයන්න.

2. මානව හිමිකම් යන සංකල්ප වර්ධනය වීමේදී ස්වකීය ආගමික හා දේශපාලනික සංස්කෘතීන්හි අඩංගු විශේෂඩු මූලධාතූන් නොසලකා හැර ඇති බව ආසියානු කලාපයේ රාජ්‍යයන් තරයේ ප්‍රකාශකර සිටී. මේ අනුව මානව හිමිකම් යන සංකල්පය ආසියානු රාජ්‍යයන්ට ආගන්තුක බවට තර්ක කරනු ලැබේ.

   ඉහත සඳහන් ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ප්‍රායෝගික උදාහරණ දක්වමින් ඔබගේ ස්ථාවරය තහවුරු කරන්න.

3. මානව හිමිකම් යන සංකල්පය ආර්ථික හා සමාජ සංවර්ධනය කෙරෙහි අගතිදායක බලපෑම් ඇති කරන්නාවූ ආකාරයෙන් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මත වැඩි වැදගත්කමක් පවරා ඇතැයි එකී සංකල්පය විවේචනය කරන්නවුන් තර්ක කරති.

   ‘මානව හිමිකම් යන සංකල්පය බෙදිය නොහැක’ යන්න අනුසාරයෙන් ඉහත ස්ථාවරයේ වලංගුභාවය අගයන්න.

4. “මේ අනුව ඇතිවන තත්වය වන්නේ අපගේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණමය බලයක් ආරෝපණය කර නොමැති ජිනිවාහි මානව හිමිකම් කමිටුව තුලින් පෙත්සම්කරුට තමා සතු අයිතිවාසිකම්වල යුක්තිසහගතබව සාක්ෂිමත ඔප්පුකොට එකී අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමට ඉල්ලා සිටිය නොහැකි වීමයි. මෙකී නිගමනය තුලින් ගම්‍යවන කරුනු අනුසාරයෙන් ප්‍රකාශ

කර සිටින්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර ජනරජයේ ඉහළම සහ අවසාන උසස් අධිකරණය වන මෙකී අධිකරණයට ස්වකීය නියෝග ඉවතලෑම හෝ වෙනස් කිරීම පෙත්සම්කරු විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර කිසිදු අධිකරණ බලයක් ආරෝපනය කර නොමැති පීනිවාහි පිහිටි මානව හිමිකම් කමිටුව විසින් එළඹි තිරණ මත පදනම්වී අයැද සිටින්නාවූ ආකාරයට කල නොහැකි බවය."

[*per* The Supreme Court of Sri Lanka in the case of <u>Nallaratnam Singarasa</u> Vs <u>Attorney General</u> (S.C. 182/ 99)]

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධව වූ ජාත්‍යන්තර සම්මුතියට හා එහි වෛකල්පිත සන්ධානයට (Optional Protocol) ශ්‍රී ලංකාව පාර්ශවයක් වීම තුලින් ඉස්මතුවන වගකීමේ පරාසය පිළිබඳව ඉහත නඩු තීන්දුව අනුසාරයෙන් සාකච්ජා කරන්න.

5. ලුබා යනු සෙරන්ඩිබ්හි දකුණු කොටසේ පසුගිය වසර දහයක කාලයක් තුල වෙනම රාජ්‍යයක් සඳහා සටන් කරන ටෙබෝ නම් වූ සුළුතර ජන කණ්ඩායමට අයත් සටන් නායකයෙක්ය. වර්ෂ 2001දී ඔහුගේ හමුදාවන් විසින් ලුබාගේ පාලනය යටතේ පැවති ප්‍රදේශවල සිටි දහස් ගණන් සිවිල් වැසියන් මරා දමන ලද අතර එම ප්‍රදේශයේ ජීවත් වූ අනෙක් ජන කණ්ඩායම් පලවා හැර ජල ප්‍රවාහන පද්ධතියද විනාශ කර සාමාන්‍ය ජනයාගේ සිවිල් ජන ජීවිතයට බාධා පමුණුවන ලදි. තවද මොවුන් විසින් එම ප්‍රදේශයේ ජීවත්වූ කාන්තාවන් විශාල ප්‍රමාණයක් කණ්ඩායම් ලෙස ස්ත්‍රී දූෂණයටද ලක් කර ඇත. එමෙන්ම ඔවුන් මෑතක සිට පැහැරගන්නා ලද ළමයින් බලහත්කාරයෙන් තම හමුදාවට බඳවාගැනීමද කරනු ලබයි.

සෙරන්ඩිබ් රාජ්‍යය වූ කලී අන්තර්ජාතික අපරාධ අධිකරණය පිළිබඳ රෝම ව්‍යවස්ථාවේ පාර්ශවයකි. "Alfa" යනු අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර එම සංවිධානය ලුබාට හා ඔහුගේ හමුදාවට එරෙහිව අන්තර්ජාතික අපරාධ අධිකරණයේදී නඩු පැවරීමට අපේක්ෂා කරයි.

"Alfa" ට උපදෙස් දෙන්න.

6. වර්ෂ 1989දී ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය එක්සත්ජාතීන්ගේ සංගමයේ මහා මණ්ඩලය විසින් ඇතිකර ගැනීමේ සිට ජාත්‍යන්තර වශයෙන් පෙර නොවූ විරූ අන්දමේ කැපවීමක් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඇතිවී තිබේ.

ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ නීතිය ජාත්‍යන්තර තත්වයනට අනුකූලව ඇත්දැයි සාකච්ජා කරන්න.

7. කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කම් පිටුදැකීම සඳහා වූ සම්මුතිය යටතේ පිහිටුවන ලද කමිටුවේ 19වන පොදු නිර්දේශය අනුව ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය යනු පිරිමින් හා සමානුරූපී

ලෙස සිය අයිතිවාසිකම් හා නිදහස භුක්තිවිඳීමට කාන්තාවනට ඇති හැකියාව ප්‍රතික්ෂෙප් කරනු ලබන එක් වෙනස් කොට සැලකීමේ තත්වයකි.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ තත්වය පාලනය කිරීමට ඇති නෛතික රාමුවේ ප්‍රමාණාත්මකභාවය පිළිබඳව විශේෂිත අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශයෙහි අනුමිතීන් පිළිබඳව සාකච්ජා කරන්න.මෙම නිති ක්ෂේත්‍රයෙහි ඇතිවී ඇති ව්‍යවස්ථාවදායක ප්‍රවේශය සහ අධිකරණමය වර්ධනයන් ඔබ විසින් සලකා බැලිය යුතුය.

8. පහත මාතෘකාවලින් ඕනෑම **දෙකක්** පිළිබඳව සටහන් ලියන්න.

(අ) සුළු ජන කොටස් ආරක්ෂා කිරීම.
(ආ) මානව හිමිකම් කතිකාව හා මරණ දඬුවම.
(ඇ) වර්ගඝාතන අපරාධය වැලැක්වීම සහ දඬුවම් කිරීම පිළිබඳව වූ සම්මුතිය .
(ඇ) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සභාව.

හිමිකම් ඇව්රිණි
*************